# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2329/16 – 2023 අප්‍රේල් 24 වැනි සඳුදා – 2023.04.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/K/2015/12.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.02.18 දිනැති හා අංක 2215/41 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.02.16 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් නාරාහේන්පිට, ඇල්විටිගල මාවත, අංක 570/1ඒ හි එච්. ඩබ්. පද්මකුමාර මයා සහ හම්බන්තොට, මහලේවාය හි පිහිටි ලංකා සෝල්ට් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.01.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අප්‍රේල් මස 03 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය

බේරුම්කරු - ආර්. එම්. ජේ. සී. රත්නායක ඉදිරිපිටදී ය.

නඩු අංකය - A/22/2021.

IR/COM/02/K/2015/12.

එච්. ඩබ්. පද්මකුමාර,
අංක 570/1 ඒ,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට.

*එදිරිව*

ලංකා සෝල්ට් ලිමිටඩ්,
මහලේවාය,
හම්බන්තොට.

2023 ජනවාරි මස 20 වැනි දින දී ය.

පෙනී සිටීම.

*පළමු පාර්ශවය වෙනුවෙන්* - නියෝජිත ජී. ඩබ්. ග්‍රේසන් ද සිල්වා මහතා

*දෙවැනි පාර්ශවය වෙනුවෙන්* - නීති නිලධාරිනී දීපානි වේරගොඩ මිය.

ප්‍රදානය

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා දියතලාව, අංක 100 ඒ, දුම්රිය කෙටිමඟ, දියතලාව හි පදිංචි රත්නායක මුදියන්සේලාගේ ජයන්ත චන්ද්‍රදේව රත්නායක වන මා 2021 පෙබරවාරි මස 21 වන දින, 2021.02.18 දින අංක 2215/41 දරන ගැසට් පත්‍රය මගින් පත් කරනු ලැබ ඇත.

ඉහත පාර්ශවයන් අතර පැවතී යැයි කියනු ලබන කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

ලංකා සෝල්ට් ලිමිටඩ් 227/4 ඒ නිර්මාණ මාවත, නාවල පාර, නුගේගොඩ කාර්යාලයේ විශේෂ ශ්‍රේණියේ මුදල් අයකැමි වශයෙන් සේවයේ යෙදී සිටි එච්. ඩබ්. පද්මකුමාර මහතා 2007.12.28 වන දින වැටුප් රහිතව වැඩ තහනමකට ලක්වී පසුව පැවති විනය පරීක්ෂණයෙන් අනතුරුව 2009.02.02 වන දින නැවත සේවයේ පිහිටුවූ නමුත් වැඩ තහනම් කර සිටි කාලය සඳහා හිඟවැටුප්, වැටුප් වර්ධක හා අනෙකුත් දීමනා ලබා නොදීම මගින් ඔහුට අසාධාරණයක් සිදුව තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද? යන්න පිළිබඳව වේ.

මෙම ආරවුල සම්බන්ධයෙන් පළමුවන හා දෙවන පාර්ශවයන් විසින් සිය පළමු හා දෙවැනි ප්‍රකාශන ඉදිරිපත් කරන ලදි. දෙවන පාර්ශවය සිය පළමු හා දෙවන ප්‍රකාශන මගින් මූලික විරෝධතාවයන් ඉදිරිපත් කරමින් සාධාරණ කාලසීමාවක් තුළ පළමු පාර්ශවය විසින් මෙම ඉල්ලීම සිදුකර නොමැති බැවින් මෙම බේරුම්කරණ ආරවුල විමසා නිසි ප්‍රදානයක් කිරීමට නිසි අධිකරණ බලයක් මෙම බේරුම්කරණ අධිකරණයට නොමැති බවට කරුණු ඉදිරිපත් කරනු ලැබ ඇත. එනමුත් පළමු පාර්ශවය සිය ප්‍රති උත්තරය හා 2022 සැප්තැම්බර් මස 22 වන දින දරන දිවුරුම් ප්‍රකාශය මගින් ඒ මූලික විරෝධතාවය අභියෝග කරමින් දක්වා ඇත්තේ මෙම ආරවුල බේරුම් කිරීම සඳහා නිසි අධිකරණ බලය ගරු බේරුම්කරුට ඇති බවයි.

ඒ අනුව ඉදිරිපත් කර ඇති සියලු කරුණු පහත දැක්වෙන පරිදි සම්පිණ්ඩනය කරමි.

පළමු පාර්ශවයේ සේවකයා වන එච්. ඩබ්. පද්මකුමාර මහතා රාජකාරි වැඩ තහනමට ලක්ව ඇත්තේ 2007 දෙසැම්බර් මස 21 වෙනි දින දෙවන පාර්ශවය වන ලංකා සෝල්ට් ලිමිටඩ් හි සහකාර සාමාන්‍යාධිකාරිගේ ''නිදහසට කරුණු විමසීම එච්. ඩබ්. පද්මකුමාර මහතා (157)'' යන ලිපියට ආනුශංගිකව දෙවන පාර්ශවය විසින් 2007 දෙසැම්බර් මස 28 දාතමින් එහි විධායක අධ්‍යක්ෂකගේ අත්සනින් හා සේවය අත්හිටුවීම එච්. ඩබ්. පද්මකුමාර මහතා මුදල් අයකැමි විශේෂ ශ්‍රේණිය'' යන ලිපියෙනි. ඒ අනුව ඒ අවස්ථාවේ නිදහසට **කරුණු ලෙස පළමු පාර්ශවය විසින් කිසිදු සැලකිරීමක් කර ඇති බවට නිරීක්ෂණ නොවේ.** ඉන් අනතුරුව 2008 මැයි මස 06 වන දින පළමු පාර්ශවය අමතා දෙවන පාර්ශවය විසින් එහි විධායක අධ්‍යක්ෂකගේ අත්සනින් ''චෝදනා පත්‍රය'' යන හිසින් චෝදනා හත (07) කින් යුතු චෝදනා පත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත. ඒ අනුව එදින සිට ආසන්න වශයෙන් මාස හයක පමණ සාධාරණ කාලයක් තුළ 2009 ජනවාරි මස 26 වැනි දින දරන දෙවන පාර්ශවයේ සාමාන්‍යාධිකාරිවරයාගේ අත්සන හා ''නැවත සේවයේ පිහිටුවීම එච්. ඩබ්. පද්මකුමාර මහතා (157)'' සහ හිසින් යුතුව පළමු පාර්ශවය එනම් එකී එච්. ඩබ්. පද්මකුමාර මහතා (04) වැනි චෝදනාවට පමණක් නිවැරදිකරු බවත්, ඉතිරි චෝදනා හයටම වැරදිකරු කරනු ලැබ ඇති බවත්, සඳහන් කරමින් එනමුත් පළමු පාර්ශවකරුගේ දිගු කාලීන සේවය සලකා බැලීමෙන් ''සානුකම්පිත විකල්පයක් වශයෙන්'' 2009 ජනවාරි 23 දින පැවති දෙවන පාර්ශවයේ 296 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ''පළමු පාර්ශවයේ සේවය අත්හිටුවා තිබූ කාලය තුළ හිඟ වැටුප් හෝ වෙනත් කිසිදු දීමනාවක් නොගෙවීමට හා වසර දෙකක කාලයක් සඳහා වැටුප් වර්ධක විලම්භනය කිරීමටත්, යටත්ව සේවයෙහි පිහිටුවීමට පළමු පාර්ශවයේ එකඟතාවය විමසනු ලැබ ඇත. ඒ අනුව පළමු පාර්ශවය විසින් සිය 2009 පෙබරවාරි 05 දාතමින් හා ''නැවත සේවයේ පිහිටුවීම එච්. ඩබ්. පද්මකුමාර මහතා (157) මුදල් අයකැමි විශේෂ ශ්‍රේණිය'' යන හිසින් යුතු ලිපියෙන් ''පළමු පාර්ශවය වෙත පමුණුවා ඇති දඬුවම් ඉවත්කර ගැනීමට අගතියක් හා හානියක් නොවන පරිදි'' යැයි සඳහන් කරමින් එදින සේවයට වාර්තා කර ඇත. ඉන් අනතුරුව 2009 පෙබරවාරි 26 වන දින පළමු පාර්ශවය විසින් දෙවන පාර්ශවය වෙත අභියාචනයක් ඉදිරිපත් කරමින් විනය පරීක්ෂණයේ තීරණය වෙනස් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබ ඇත.

නමුත් අධ්‍යක්ෂ මණ්ඩලය එයට ප්‍රතිචාරයක් දැක්වූ බවත් නොපෙනේ. එයට ප්‍රතිචාරයක් නුවූ කල පළමු පාර්ශවය විසින් **ඉන් වසර තුනකට පසු 2012 අප්‍රේල් මස 04 වැනි දින** දෙවන වතාවට ද දෙවන පාර්ශවයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලබනු ඇත. එනමුත් එයට ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කිසිදු ප්‍රතිචාරයක් දක්වා නැත. ඉන් වසරක් ඇවෑමෙන් 2013 අප්‍රේල් මස 03 වැනි දින පළමු පාර්ශවය විසින් එම අභියාචනය නැවතත් දෙවන පාර්ශවයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරනු ලැබ ඇත. එයට ද අධ්‍යක්ෂ මණ්ඩලය කිසිදු ප්‍රතිචාරයක් දක්වා ඇති බව නිරීක්ෂණය නොවේ. 2009 පෙබරවාරි 26 දින සිට 2013 අප්‍රේල් 03 වන දින දක්වා වසර හතරකට අධික කාලයක් පළමු පාර්ශවය විසින් තමාට චූදිතයකු කොට නිසි විනය පරීක්ෂණයක් පවත්වා හෙළිදරව් වූ ''අවිනය'' හා ''අක්‍රමිකතා'' මත ඔහුව චෝදනා හතකින් හයක් සඳහා වරදකරු බවට තීරණය කොට ''සානුකම්පිත හේතූන් මත'' සේවාමුක්ත කාලය සඳහා හිඟ වැටුප් රහිතව හා වැටුප් වර්ධක දෙකක් විලම්භනය කිරීමට යටත්ව නැවත සේවයේ පිහිටුවූ දෙවන පාර්ශවය වෙත නැවත නැවතත් අභියාචනා ඉදිරිපත් කරමින් සිට ඇති බව නිරීක්ෂණය වේ. දෙවන පාර්ශවය විසින් බේරුම්කරණය වෙත ලබා දී ඇති විනය පරීක්ෂණ වාර්තාවේ ඇති කරුණු අනුව පළමු පාර්ශවය විසින් අවිනයවත් අක්‍රමිකතා සිදු කර ඇති බවට ද නිරීක්ෂණය වේ.

**ඉන් අනතුරුව පළමු පාර්ශවය විසින් කම්කරු කොමසාරිස් වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ 2014 මාර්තු මස 20 වැනි දිනය. එනම් විනය නියෝගයෙන් වසර පහක කාල සීමාවක් ද ඉක්ම වූ පසුය.**

එහිදී නඩුවේ අදාළ කාලාවරෝධය සම්බන්ධයෙන් විෂය භාර අමාත්‍යවරයාගේ බලතල සම්බන්ධයෙන් වූ නීතිමය රැකවරණය

අ. Nadaraja Vs Krishnadasan (1975) NLR 255 දරන ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවත්

ආ. Colombo apothecaries company Ltd Vs. Wijesuriya (1968) 70 NLR 481 Walker Sons Co. Ltd. Vs Fry (1966) 68 NLR 73 දරන නඩු තීන්දුවක් පිළිබඳ පළමු පාර්ශවයේ දෙවන ප්‍රකාශයෙන් සඳහන් කර ඇති මුත් **කරුණු පිළිබඳ තහවුරු කිරීමට අදාළ නඩු තීන්දු අමුණා නොතිබීම සැළකිය යුතු අඩුපාඩුවක් ලෙස දකිමි. අඩු තරමින් නඩුවෙහි හරය හෝ උපුටා දැක්වීම් කළ යුතුව තිබුනි.**

එමෙන්ම පළමු පාර්ශවයේ පළමු ප්‍රකාශයේ පස්වන පිටුවේ අවසන් ඡේදයේ අවසන් වැකිය අනුව මෙලෙස විනය දඬුවම් පැමිණවීම ''ස්වභාවික යුක්ති මූලධර්ම වලට'' පටහැනි බව සඳහන් කරයි.

මෙය හුදෙක්ම ''ස්වභාවික යුක්ති මූලධර්ම'' පිළිබඳව පළමු පාර්ශවයේ සම්පූර්ණ දුරවබෝධය උද්දීපනය කරයි.

ස්වභාවික යුක්ති ධර්මයේ නීති යනු,

1. "Audi altarem partem" එනම් සියලු පාර්ශව වලට සමාන ලෙස කන්දිය යුතුය.
   යන්න හා
2. "Nemo judex in causa sua" එනම් තමාගේ නඩුව තමා විසින් විනිශ්චය නොකළ යුතුය.
   යන්නයි.

ඒ අනුව ස්වභාවික ''යුක්ති ධර්මයේ මූල ධර්ම'' උල්ලංඝනය කිරීමක් අදාල විනය පරීක්ෂණ සම්බන්ධව සිදු වී නොමැති බව නිරීක්ෂණය වන අතර එම සඳහන හුදෙක්ම ස්වභාවික යුක්තියේ මූලධර්ම පිළිබඳව හුදු දුරවබෝධය හේතුවෙන් සඳහන් කරන ලද්දක් බව පෙනී යයි.

එමෙන්ම පළමු පාාර්ශවය ''සානුකම්පිත හේතූන් මත'' නැවත සේවය පිහිටුවනු ලැබ ඇත්තේ දෙවන පාර්ශවයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුවය.

ඒ අනුව 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වසර හතරකට වැඩි කාලයක් එම දෙවන පාර්ශවය අධ්‍යක්ෂ මණ්ඩලය වෙතම එකම අභියාචනය නැවත නැවතත් පළමු පාර්ශවය විසින් ඉදිරිපත් කිරීම තර්කානුකූල කටයුත්තක් නොවේ.

සාමාන්‍ය වශයෙන් එක් අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් ගනු ලැබූ තීරණයක් අනුශංගික අධ්‍යක්ෂක මණ්ඩල මගින් වෙනස් නොකිරීම සම්ප්‍රදායකි.

**කරුණු එසේ තිබියදී පළමු පාර්ශවය සිය අභියාචනය විධිමත් අභියාචනාධිකාරීන් වන කම්කරු කොමසාරිස් හෝ කම්කරු විනිශ්චය සභාවක් වෙත යොමු කිරීම සඳහා වසර පහක් ඉක්මවන කාලයක් ගත කර ඇත.**

එයට හේතු වශයෙන් පළමු පාර්ශවය විවෘත බේරුම්කාර මණ්ඩලය ඉදිරියේ වාචිකව ප්‍රකාශ කර සිටියේ ''පළමු පාර්ශවය සේවයෙහි යෙදී සිටියදී එලෙස බාහිර අභියාචනාධිකාරියක් වෙත යොමු වුවහොත් තමා දෙවන පාර්ශවයේ ද්වේශ සහගත පළිගැනීමට ලක්විය හැකිය'' යන තර්කයයි.

''ලංකා සෝල්ට් ලිමිටඩ්'' යනු රාජ්‍යානුබද්ධ සමාගමක් වේ. ඒ අනුව පෞද්ගලික ආයතනයක එවන් පුද්ගල බද්ධ වූ තත්ත්වයන් මත එලෙස පෞද්ගලික පළිගැනීම් සමහර විට සිදුවිය හැකි යැයි උපකල්පනය කළ හැකි වුවත් ව්‍යවස්ථාපිත රාජ්‍ය අනුබද්ධ ආයතනයක එලෙස සිදුවේ යැයි තර්ක කිරීම යුක්ති නොවේ.

ඒ අනුව දෙවන පාර්ශවය විසින් 2022 මාර්තු මස 23 වන දින ඉදිරිපත් කරනු ලැබූ ලිඛිත දේශනය මගින් දෙවන වරට ද ඉදිරිපත් කර ඇති මූලික විරෝධතා පිළිබඳ අවධානය යොමු කරමි.

එමගින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනා 22/2012 හා SC (SPL) CA 2011 හා
Ca (Writ) Application No. 99/2006

දරන නඩුවේ සම්පූර්ණ වාර්තා ගොනුකර ඇත. එහි පැහැදිලි ලෙස සඳහන්ව ඇත්තේ,

"It is obvious that when an award is made, the terms of the award becomes implied terms attached to the contract of employment. So, there should be an exiting contract of employment for the award to take effect at the time of making the award at the end of the arbitration. This section presupposes the existence of a valid contract between the employee and the employer" යන ලෙසිනි.

පළමු පාර්ශවය 2016 මැයි මස 25 වැනි දින සේවයෙන් විශ්‍රාම ලබයි. ඒ අනුව මෙම බේරුම්කරණය යොමු වද්දීත් සේව්‍ය සේවක ගිවිසුමක් පළමු පාර්ශවය හා දෙවන පාර්ශවය අතර පැවතී නැත.

ඒ අනුව බලනකල බේරුම්කරණ මණ්ඩලයක් වෙත යොමු වීමට ද වසර පහකට පෙර පැවති ආරවුලක් බේරුම්කරණය කිරීමට බේරුම්කාර අධිකරණයට අධිකරණ බලයක් නොමැති බව නිරීක්ෂණය කරමි.

එමෙන්ම අභියාචනාධිකරණ නඩු අංක Ca (Writ) Application No. 90/06 ද නියමිත නඩු වාර්තා සමඟ දෙවන පාර්ශවය විසින් සිය දෙවැනි මූලික විරෝධතා සමඟ ගොනුකර සිටියි. එහි ඇමුණුම් ලෙස දක්වා ඇති SLLR (2002)2 Sri LR හි 128 අනුව

CA-LA No. 26/2001 – 2001 July 19 හි පැහැදිලිව "Acts Which Tend to make a restraining order negatory must necessarily be prevented especially when an act appears to be of a recent origin which compels a party to seek such relief. Interim relief is equitable relief. **Delay would defeat equity.** යනුවෙන් සඳහන් වෙයි.

පළමු පාර්ශවය විසින් 2022 සැප්තැම්බර් මස 23 වැනි දින පළමු පාර්ශවය විසින් සිය නියෝජිත ජී. ඩබ්. ග්‍රේෂන් සිල්වා මහතා මගින් නීතිඥ හා නොතාරිස් බී. එච්. නලින් ආර්. පෙරේරා මහතා ඉදිරිපත් කරනු ලැබ ඇති දිවුරුම් ප්‍රකාශයක් 4 හි සඳහන් ''බේරුම්කරුවකු පත් කිරීමේ දී අමාත්‍යවරයාට පැමිණිලි ඉදිරිපත් වන කාලසීමාව කල නොහැකි අතර එම තත්ත්වය උපරිමාධිකරණ නඩු නියෝග අනුව හබ කිරීමට නොහැකි බවත්, ලෙස සඳහන් කර තිබීම විමතිය දනවන කරුණක් වන අතර නීතියේ නිශ්චිත ප්‍රතිපාදනයක් වන “Precedent theory” එනම් ''පූර්වාදර්ශ'' න්‍යාය එනම් උපරිමාධිකරණ විනිශ්චිත නඩු තීන්දු මගින් එයට පහලින් පවත්නා සියලු ආකාරයේ අධිකරණ හා විනිශ්චය අධිකරණයෙන් බැඳෙන බව වන අතර මූලික නීතිය පිළිබඳ දුරවාබෝධය හේතුවෙන් එලෙස සඳහන් කර ඇති බව නිරීක්ෂණය කරමි.

එමෙන්ම බේරුම්කරණයක් වෙත යොමු විය යුතු කාලරාමුවක් පිළිබඳව නීතිය නිහඬ බව සැබෑය. එනමුත් සේවකයකුට සිදුවිය හැකි නරකම තත්ත්වය වන සේවයෙන් පහකිරීමකදී වුව ද අදාළ පනතේ ප්‍රතිපාදන අනුව මාස හයක් ඉකුත් වීමට පෙර අභියාචනයක් ඉදිරිපත් කළ යුතුය.

ඒ අනුව බලන කල බේරුම්කරණ මණ්ඩලයක් වෙත යොමු කළ යුතු කාල සීමාව එක් එක් සිද්ධිය අනුව බැලූ බැල්මට සාධාරණය වන කාලසීමාවක් තුළ විය යුතුය. සිය අභියාචනය කම්කරු කොමසාරිස් වෙත යොමු කළ දිනය වන විනය නියෝගයෙන් වසර පහක් ද ඇවෑමෙන් වන දිනය ඒ අනුව යුක්ති යැයි ගරු බේරුම්කරණයට පෙනී යන්නේ නැත.

අනෙක් අතට සේවකයා යනු සේවකයන් ඉවත් වූ අයෙකු ද ඇතුළත් බව 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ 48 වගන්තිය මගින් දක්වා ඇතත්, සේවයෙන් ඉවත් වූ අයකු සම්බන්ධව කටයුතු කිරීමේ දී ඔහුගේ අයිතීන් සත්‍ය වශයෙන් සේවාසන්න ප්‍රතිලාභ සඳහා පමණක් සීමාවන බව අදාළ නීති රාමුව සම්පව අධ්‍යයනය කිරීමේ දී පෙනී යයි.

ඒ අනුව දෙපාර්ශවයේ පළමු හා දෙවන ප්‍රකාශ ද පළමු පාර්ශවය විසින් ගොනුකරන ලද 2022 සැප්තැම්බර් 23 දරන දිවුරුම් ප්‍රකාශය ද සළකා බැලීමෙන් අනතුරුව පහත නිගමනයට එළඹෙමි. ඒ අනුව දෙවැනි පාර්ශවය විසින් නිසි නීති උද්ධෘත ද සහිතව ගොනු කරන ලද මූලික විරෝධතා දෙකම සළකා බැලීමෙන් අනතුරුව ඒවායේ සඳහන් කරුණු පිළිගනිමින් මෙම ආරවුල විභාගකොට ප්‍රදානයක් ලබාදීමට අධිකරණ බලයක් මෙම බේරුම්කරණ විනිශ්චය සභාවට නොමැති බව තීරණය කරමි.

පළමු පාර්ශවය විසින් යුක්ත කාලසීමාවක දී සිය අයදුම්පත බේරුම්කරණයක් සඳහා යොමුකර නැත යන දෙවන පාර්ශවයේ විරෝධතා පිළිගනිමි. කරුණු එසේ හෙයින් මෙම ආරවුල පිළිබඳ තවදුරටත් විභාගයක් පවත්වාගෙන යැමට මෙම බේරුම්කරණයට අධිකරණ බලයක් නොමැති බැවින් පරීක්ෂණ අද අවසන් කරමි.

ඒ අනුව පළමු පාර්ශවයේ ඉල්ලීම් සම්බන්ධව කිසිදු ප්‍රදානයක් කිරීමට හැකියාවක් නොමැත. මෙය සාධාරණ හා යුක්ති යුක්ත තීරණයක් බවට තීරණයක් කරමි.

ආර්. එම්. ජේ. සී. රත්නායක,
බේරුම්කරු.

2023 ජනවාරි මස 20 වැනි දින දී ය.

EOG 04 – 0165